"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி" கட்டடம், 32, ஸ்ரீமத் மார்க்கஸ் பெர்னாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi Mandiraya", 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

Chief Secretary } Telephone 2698409 / Fax 2694667 / Email chiefsecretary@wpc.gov.lk

General Telephone } 2682868 2682869 2682870

My No. } CSO/ENG/1/8/32 Your No. } Date. } 2016.07.30

පළාත් ගොඩනැඟිලි අධ්‍යක්ෂ/ පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ,

සභාපති, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය(බ.ප.),

පළාත් පාලන කොමසාරිස් සහ සියලුම පළාත් පාලන ආයතන ලේකම්වරුන්,

බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියලුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්

**<u>සුළු වාරිමාර්ග ගාස්තු උපලේඛණය -2016</u>**

2016.08.01 දින සිට නැවත දැනුම් දෙන තුරු ඉදිකිරීම් ඇස්තමේන්තු පිළියෙල කර ගැනීමට උපයෝගී කරගතයුතු සුළු වාරිමාර්ග ගාස්තු උපලේඛනයේ පිටපතක් මේ සමඟ එවමි.

02. මෙම රේට් මිල ගණන් පිළියෙල කිරීමේදී එකතු කළ අගය මත බදු ( VAT ) ,රේට් මිල ගණන් වලට අඩංගු කර නැත.ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී එකතු කල අගය මත බදු ,ප්‍රමාණ බිල්පතේ මුළු එකතුවට අමතර මුදලක් වශයෙන් එකතු කළ යුතුය.

03. ලේඛනයේ සඳහන් රේට් මිල ගණන් සකසා ඇත්තේ බස්නාහිර පළාතේ දිස්ත්‍රික් තුනම ආවරණය වන පරිදි හා විවෘත වෙළඳපලේ පවතින මූලික ද්‍රව්‍ය මිල ගණන් වල සාමාන්‍ය අගයන් පදනම් කර ගැනීමෙනි.කෙසේ වුවද,මෙහි සඳහන් ද්‍රව්‍ය වල මිල හා ඔබගේ බල ප්‍රදේශය තුල පවතින මිල ගණන් අතර සැලකිය යුතු වෙනස්කම් තිබේනම් ,ඒ පිළිබඳව මා වෙත දැන්වීමට පියවර ගන්න.එවැනි විශේෂ අවස්ථාවකදී යම් බල ප්‍රදේශයකට පමණක් සීමාවන පරිදි මිල ගණන් සංශෝධනය කිරීමට පියවර ගත හැක.

04. ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී භාවිතා කිරීම සඳහා මෙම ලේඛනයේ පිටපත් අදාල කාර්මික නිලධාරීන් වෙත කරුණාකර නිකුත් කරන්න.

05. මෙම රේට් මිල ගණන් පිළියෙල කර ඇත්තේ සුළු වාරිමාර්ගද්‍රව්‍ය වල ගුණාත්මක බව (material quality ) සහ ඉදිකිරීම් නිමාව (Workmanship) ශ්‍රී ලංකා (SLS) ,බ්‍රිතාන්‍ය (BS) සහ (A.S.T.M) ප්‍රමිතීන්ට අනුකූලව සහICTAD පිරිවිතරSCA/3/1,SCA/3/2,SCA/3/3, SCA/4(VOL–I ),SCA/4(VOL - II),SCA/5,SCA/8

යන ප්‍රකාශනවල සඳහන් ගුණාංගයන් සපුරාලන බව උපකල්පනය කරමිනි. ඒ අනුව මෙම මිල ගණන් උපයෝගී කර ගැනීමේදී ඉහත ප්‍රකාශනවල අඩංගු ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකිරීම් සිදුවිය යුතු බව අවධාරණය කරනු කැමැත්තෙමි.

ඩබ්.එම්.ඩී.එන්.රණසිංහ,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු),

බස්නාහිර පලාත.

පිටපත්:

1. ප්‍රධාන ලේකම් (බ.ප.)
2. බස්නාහිර පලාතේ සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
3. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
4. විගණන අධිකාරි
5. ප්‍රධාන ලේකම් (බ.ප.)
6. බස්නාහිර පලාතේ සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
7. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
8. විගණන අධිකාරි